"An elected dictatorship with democratic structures is needed: Sajith" යන සිරස්තලයෙන් යුතුව, ඩේලි මිරර් පුවත්පතේ (ජනවාරි 24, 2022) පළමු පිටුවේ ඉහළ කොටසේ පළවූ ලිපියකි. කෙසේ නමුත්, සමගි ජන බලවේගය මගින්, එම ලිපිය විපක්ෂ නායක සජිත් ප්‍රේමදාසගේ කථාවේ අඩංගු වූ කරුණු විකෘති කරමින් පළ වී ඇති බවට ඩේලි මිරර් වෙත පැහැදිලි කිරීමක් යොමු කර ඇත. ඩේලි මිරර් පුවත්පතෙහි (ජනවාරි 25, 2022) පළමු පිටුවේ පහත කොටසේ එම පැහැදිලි කිරීම ලැබුණු ආකාරයෙන්ම පළ කෙරී ඇත.

"යම් කිසි පළවූ වාර්තාවක් කරුණු අතින් වැරැදි යැයි කර්තෘට පෙනී යන අවස්ථාවකදී එය නිසි ප්‍රමුඛතාවක් ඇතිව සහ යෝග්‍ය වන්නේ නම් සමා අයැදීමක් ද ඇතිව, එම නිවැරැදි කිරීම හා සමා අයැදීම පීඩිත පාර්ශවයේ කැමැත්තට පටහැනි වන අවස්ථාවකදී හැර, අනෙක් හැම විටෙකදීම වහාම පළ කොට එය නිවැරැදි කළ යුත්තේය" යනුවෙන් මාධ්‍ය ආචාර ධර්ම තුළ සඳහන් වේ.

ඉහත සඳහන් ලිපිය සහ පසුව පළ කෙරුණු කරුණු දැක්වීම පිළිබඳව අපගේ නිරීක්ෂණ මෙසේ වෙයි.

1) මෙහි කණගාටුව ප්‍රකාශ කිරීමක් හෝ පුවත්පතේ පාර්ශවයෙන් කරුණු පැහැදිලි කිරීමක් දක්නට නොමැත.

2) ඒ වෙනුවට, සමගි ජන බලවේගය විසින් එවූ කරුණු පැහැදිලි කිරීම ඒ ආකාරයෙන්ම Clarification යන ශීර්ෂය යටතේ පළ කර ඇත.

3) ඔබ සිතනා ලෙසට, කණගාටුව ප්‍රකාශ කිරීමක් පුවත්පත පාර්ශවයෙන් පළ වී නොමැත්තේ, ඩේලි මිරර් පළ කළ මුල් ලිපිය කරුණු අතින් වැරැදි යැයි කර්තෘ මණ්ඩලය නොපිළිගැනීම ද?

4) එසේ නම්, ඔබ සිතන ආකාරයට, ඒ පිළිබඳව සිය ස්ථාවරය ද ඩේලි මිරර් පළ කළ යුතු නොවන්නේ ද?

ඔබේ අදහස?